# "අපි වවමු - රට නඟමු"

## දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීම ජාතික මෙහෙයුම තුළින්

# කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නව පිබිදීමක්

ලෝකයේ කලින් කලට විවිධ වූ අර්බුද පැන නැගීම ස්වභාවයකි. පසුගිය කාලයේ බලශක්ති අර්බුදය, මූල්‍ය අර්බුද, දේශගුණික අර්බුද ඇතිවිය. මේ සියල්ල හමුවේ කිසිවෙක් ඉවසිය නොහැකි ආහාර අර්බුදය ද ලෝකයේ සමහර රටවල් වෙලා ගත්තේය. එසේ වුවද වාසනාවකට මෙන් ශ්‍රී ලංකාවට ආහාර අර්බුදය බලවත් ලෙස බලපෑවේ නැත. 2007 සැප්තැම්බර් 03 වනද "අපි වවමු - රට නගමු"- දේශීය ආහාර නිෂ්පාදනය ජාතික මෙහෙයුම ආරම්භ කෙරිණ. මෙම වැඩසටහන යටතේ ගොවි ජනතාවට මෙන්ම සාමාන්‍ය ජනතාවද තම ගෙවත්තේ මොනයම් හෝ දෙයක් සිටුවීමටත්, එල නෙලා ගැනීමටත් උනන්දු විය. ඒ අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධන වේගය ක්‍රමයෙන් ඉහළ ගිය අතර, ශ්‍රී ලංකාව ආහාර අහේනියකට බරපතල ලෙස මුහුණු දුන්නේ නැත.

ලෝකයේ ආහාර බෙදියාමේ අසමතුලිතතාවයක් පවති. ලෝකයේ ආහාර නිෂ්පාදනයෙන් 50% ක් පමණ පරිභෝජනය කරනු ලබන්නෙ සංවර්ධිත යයි සම්මත රටවල සිටින 10% කට ආසන්න ජනතාවක් විසින්. ආහාර නිෂ්පාදනයේ ඉතිරි 50% ප්‍රමාණය පරිභෝජනය කරන්නේ ඌණ සංවර්ධිත හා සංවර්ධනය වන රටවල සිටින ඉතිරි 90%ක් පමණ වූ ජනතාව විසිනි. මෙම අසමතුලිත ආහාර බෙදී යාම නිසා පීඩනයට පත්වන රටවල ජනතාවට කුසගින්නේ සිටීමට පවා සිදුවී තිබේ. සංවර්ධිත රටවල ආහාර නිෂ්පාදනය කිරීම පහසුවෙන් කළ හැකි වුවද වෙනත් කාර්මික කටයුතු වලට යෙදවීමෙන් වෙනත් රටවල කෘෂි නිෂ්පාදන ආනයනය කිරීම සිදු කරනු ලැබේ. එසේම සංවර්ධිත රටවල ආහාර පරිභෝජනයද නිසි රටාවක් නැති අතර, ආහාර අපතේ යාමද විශාල වශයෙන් සිදු වේ. මේ නිසා ශ්‍රී ලංකාව කල්යල් බලා දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික වැඩසටහනක් ආරම්භ කර ප්‍රතිඵල නෙළා ගැනීමට සමත්වී තිබීම සතුටට කරුණෙකි.

කේ.බී. ගුණරත්න
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (මාධ්‍ය)

වර්තමාන රජය විසින් පොහොර සහනාධාරයක් ගොවීන්ට හඳුන්වා දීම තුළින් විශාල ප්‍රතිලාභයක් ගොවි ජනතාවට අත්වී තිබෙනවා මෙන්ම කෘෂි කර්මාන්තයේ ප්‍රගතියට එය හේතු වී තිබේ. 2008 වසර ගත්කල 2008 යල කන්නයට රුපියල් මිලියන 5994.58 ක් වටිනා යූරියා මෙට්‍රික් ටොන් 117605.75ක්ද, රුපියල් මිලියන 3499.42ක් වියදම් කරමින් ටී.එස්.පී. මෙට්‍රික් ටොන් 36608.84ක්ද, රුපියල් මිලියන 2804.60ක් වියදම් කරමින් එම්.ඕ.පී. මෙට්‍රික් ටොන් 42968.89 ක්ද රටින් ගෙන්වා ගොවි ජනතාව වෙත ලබාදී ඇත. එසේම 2008/2009 මහ කන්නය සඳහා පිළිවෙලින් යූරියා රුපියල් මිලියන 20290.00 ක් වැයකර මෙට්‍රික් ටොන් 200191 ක්ද, ටී.එස්.පී. රුපියල් මිලියන 12797.00 ක් වැයකර මෙට්‍රික් ටොන් 89765 ක්ද, රුපියල් මිලියන 9172.00 ක් වැයකර ම්.ඕ.පී. මෙට්‍රික් ටොන් 74219 ක්ද ලබාදී

ඇත. මේ ආකාරයේ පොහොර සහනාධාරයක් ලබා දෙන වෙනත් රටක් ලෝකයේ නැති තරම් විය හැක. ගොවියන්ද මෙම පොහොර සහනාධාරයෙන් උපරිම ප්‍රයෝජන ගෙන ඇත.

පොහොර සහනාධාරය ලබාදීම නිසා ඇතිවූ ප්‍රතිඵල නම් වගා කිරීමේ වියදම හා එමඟින් නිෂ්පාදන වියදම අඩුවී වගාව ලාභදායි ව්‍යවසායක් බවට පත්ව ඇත. පුරන්වී ඇති කුඹුරු ක්‍රමයෙන් වී වගාවට යොදා ගෙන ඇත. කෘෂි කර්මයෙන් බැහැරව සිටි ඇතැම් ගොවී වී වගාවට නැවත නැඹුරු වී ඇත. ඒකීය භූමි ප්‍රමාණයකින් ලැබෙන අස්වනු හා නිෂ්පාදනය වැඩිවී ඇත. සමස්ථයක් වශයෙන් ගත්කළ සමාජ හා ආර්ථික ධනාත්මක වෙනසක් ඇති වීමට මෙම පොහොර සහනාධාරය සමත්වී ඇත.

විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ ගෙවතු වගාව කිසි කලෙකත් නොමැති අයුරින් වර්ධනය වී තිබීමයි. පාසැල් මට්ටමෙන් පාසැල් සිසුන් අතරද කාර්යාල අතරද, ගෘහණියන් අතර ද, දේශපාලඥයන් අතර හා පෞද්ගලික අංශයේද විශාල උනන්දුවක් ඇති විය. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ බල ප්‍රදේශය තුළ එක් ආදර්ශ ගෙවත්තක් පවත්වාගෙන යාමත් ඒ අනුසාරයෙන් කන්නයෙන් කන්න විශාල ගෙවතු සංඛ්‍යාවක් ඇති කිරීමටද පියවර ගැණින. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම නාගරික ප්‍රදේශවල විශාල පිබිදීමක් ඇති වී ගෙවතු විශාල සංඛ්‍යාවක් බිහිවිය. මෙහි ප්‍රතිඵලය වුයේ දේශිය ආහාර නිෂ්පාදනය වැඩි දියුණු වීමත්, එළවළු ආදියේ නිෂ්පාදනය ඉහළ යාමත්ය.

තවද, විශේෂයෙන් බෝග 36ක් හඳුනාගෙන ඒ ඒ බෝග සඳහා විශේෂඥ නිලධාරින් පත්කොට ඒ ඒ බෝගවල ප්‍රවර්ධනයක් ඇති කිරීමට පියවර ගැනිණ. පසුගිය වසර දෙක ඉතා සාර්ථක ප්‍රගතියක් අත්පත් කරගත් අතර, ජාතික අවශ්‍යතාවයට ප්‍රමාණවත් තරම් නිෂ්පාදන ඇති කිරීමට සමහර භෝග සමත්වී තිබේ. මේ නිසා ඉදිරි කාලයේදී සමහර භෝග ආනයනය කිරීම සීමා කිරීමට හැකියාව ලැබේ. දැනටමත් බඩඉරිඟු, ඉඟුරු, කුරක්කන් වැනි බෝග මේ තත්ත්වයට පත්වී තිබේ.

වර්තමානයේ රාජ්‍ය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකර්ම අංශයෙන් ලබා දෙන්නා වූ දයකත්වය ක්‍රමික අඩුවීමක් දශක ගණනාවක සිට පෙන්නුම් කරයි. 1950 දශකයේදී කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් දළ දේශිය නිෂ්පාදිතයට 40%ක පමණ දයකත්වය ලබාදුන් අතර, 1975 දී එය 32.4ක් 2004දී එය 17.9 ක් ලෙස පසුබැමට ලක්ව 2008 වන විට 12% ක් දක්වා පහත බැස ඇත. එබැවින් "අපි වවමු - රට නගමු" දේශිය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම වැනි ඵලදයි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඉතා ඵලදායි වී තිබේ.

වර්තමානයේදී කෘෂිකර්මය එසේත් නැතිනම් ගොවිතැන යන්න ආදයම් ඉපැයිය නොහැකි අලාභ ව්‍යාපරයක් ලෙස සමහරු සිතුවද ක්‍රමානුකූලව කටයුතු කරමින් කෘෂි කර්මාන්තය තුළින්ම ජිවිතයේ යස ඉසුරු උපයාගත් අය බොහෝය. එසේ හෙයින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටු දැකීමට රැකියා වියුක්තිය අවම කිරීමට ගොවි ජනතාව සවිබල ගැන්වීමට සාර්ථකම ක්‍රියාදමය වන්නේ දේශිය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ මෙහෙයුමයි. මේ සඳහා අවශ්‍ය උපාය මාර්ග නව තාක්ෂණය අනුව වගා කරන ලද ශිල්පිය ක්‍රම, දැනුම හුරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ ආයතන වලින් ලබාදෙන අතර, එම පහසුකම් ලබා ගැනීමට මහජනතාවද තව තවත් උනන්දු විය යුතුය.